# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,897 — 1970 මාර්තු 13 වැනි සිකුරාදා — 1970.3.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 375 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 396 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 384 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 385 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| ස්ථිරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| වඩු බාහිරාදිය විකිණීම ... ... ... | 395 | විවිධ දැන්වීම් ... ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියය 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වනන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත'නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූල ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේ දී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්ව යක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළ දී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාලපරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/ පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගය කින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාල නො වන්නේ ය.)

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසු කම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ ඈතුර තමන් සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින් ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසි යට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතු වෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒ ඒ. 13/එක්ස්. 2214/70.

## ලංකාණ්ඩුවේ දුම්රිය සේවය

### (සිවිල්) ඉංජිනේරු තනතුරු

ලංකාණ්ඩුවේ දුම්රිය සේවයේ (සිවිල්) ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හිවූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 31 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 අප්‍රේල් මස 3 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට, අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්දාවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවර යෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි.**—(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. පත්කරනු ලබන්නන් අවුරුදු තුනක කාලයක් පුහුණුව ලැබිය යුතු අතර, ඔවුන් එම කාලය තුල ආධුනිකත්වයෙහි තබනු ලැබේ. ඔවුන් වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

තෝරාගත් අපේක්ෂකයෝ, පත්වීම ලැබීමට පෙර, සම්මත අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයකින් සමත්විතව, ශාරීරික යෝග්‍යතාවය නිගමනය කිරීම සඳහා පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුත්තාහ. ඔවුන් තුන් අවුරුදු පුහුණුව විශ්වාසවන්තවද, අනලස්වද සපුරාලීමට සහ පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව යටත් පිරිසෙයින් අවුරුදු 10ක් වත් රජය සඳහා සේවය කිරීමේ ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත්විය යුතුය. බැඳුම්කරයේ මුදල රු. 23,000 ක් වේ.

(ii) පුහුණුවීමේ පාඨමාලාව දුම්රිය සේවයේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් පිළියෙළ කරනු ලබන පරිදි වේ. මෙම කාලසීමාව තුළදී දුම්රිය සේවයේ වැඩ පිළිබඳ පලපුරුද්දක් හා පුළුල් අවබෝධයක් මෙන් ම වගකීම ඉසිලීමේ හැකියාවක් ලබනු පිණිස අතිරේක දීමනාවක් නොමැතිව ඕනෑම තනතුරක වැඩබැලීමට හෝ ඕනෑම රාජකාරීන් ඉටු කිරීමට පත්වීම්ලත් අපේක්ෂකයින් ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

(iii) පත්කරනු ලැබුවත් තුන් අවුරුදු ආධුනික කාලය තුළදී පහත සඳහන් විෂයයන්ගෙන් සමත්විතව පැවැත්වෙන පරීක්ෂණවලින් විශිෂ්ඨ සාමාර්ථයක් ලබාගත යුතුයි :—

(අ) දුම්රිය ආරක්ෂක නීති හා රෙගුලාසි ;

(ආ) දුම්රිය දෙපාතීමේන්තුවට අදාල පරිදි, දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් (පාලන), රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, කායඞ සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි, මුදල් රෙගුලාසි ආදිය ; සහ

(ඇ) මාර්ග හා කර්මාන්ත විශේෂ නීති.

(iv) ඔවුනු තුන් අවුරුදු ආධුනික කාලය තුළදී සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් විය යුත් තාහ.

(v) පුහුණුව ලබන්නන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කවර අංශයක හෝ පුහුණුව වෙනස්කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට හැකිය. නියමිත කවර කොන්දේසියක් වුවද, ඉටුකිරීමට ඔවුන් අපොහොසත් විනම් හෝ පුහුණුවීමේ කවර අවස්ථාවකදී වුවද ස්වකීය වැඩ සහ හැවැත්ම පිළිබඳව සතුටුදායක වාර්තා ලබාගැනීමට නොහැකිවි නම් හෝ ඔවුන්ගේ පත්වීම් නතර කිරීමට ඉඩ ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය :—

වර්ෂයකට රු. 7,800—360×3—8,880/9,600—360×4—480×11—රු. 16,320.

(වර්ෂයකට රු. 9,600 සහ රු. 13,920 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද වේ.)

**සටහන :**

(i) පත්වීම් ලබන්නන් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 13,440 වාර්ෂික වැටුප ඉක්මවීමට ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය හෝ සාමාජිකත්වය ලබාගත යුතුය.

(ii) ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය හෝ සාමාජිකත්වය හිමි අයදුම්කරුවකු මේ තනතුරට පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 9,960 ක ආරම්භක වැටුප මත තබනු ලැබේ.

(iii) තෝරාගත් අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 9,960 ක වැටුප් පියවරට එළඹීමට පෙර ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ අධිසාමාජිකත්වය හෝ සාමාජිකත්වය ලබාගතහොත්, ඔහු එම සුදුසුකම් ලබාගත් දින සිට වර්ෂයකට රු. 9,960 ක වැටුපක් ලැබීමට සුදුසුවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) 1970 මාර්තු මස 31 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු වූද, අවුරුදු 30ට නොවැඩිවූද බව,

(සී) (i) ලංකා විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධියක් (සිවිල්) හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇති බව ; නැතහොත්

(ii) ලන්ඩන්හි සිවිල් ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I හා II වැනි කොටස්වලින් සාමාර්ථයක් හෝ සමාන සුදුසුකමක් ලබා ඇති බව ; නැතහොත්

(iii) ලංකා ඉංජිනේරු ආයතනයේ සිවිල් ඉංජිනේරු විභාගයේ I, Iබී හා II වැනි කොටස්වලින් සාමාර්ථයක් ලබා ඇති බව.

**සටහන :** (i) යථෝක්ත සුදුසුකම් ලබා ඇති දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ වයස අවුරුදු 30ට වැඩිවූවද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 40ට නොවැඩි නම් ඔවුන්ට අයදුම් කළ හැකිය.

(ii) 1961 අංක 70 දරණ අනිවාර්ය රාජ්‍ය සේවා පනත යටතේ ඉංජිනේරු තනතුරුවලට පත්කරනු ලැබ සිටින ඉංජිනේරුවන් ද මෙම තනතුරුවලට ඉල්ලුම්කිරීමට සුදුස්සෝ වෙති.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත්කරන ලද ("අ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මෙම කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ලැබුණ බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

සී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 5 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය,
තැ. පෙ. 500.

3–172/1—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ. 107/එක්ස්. 2215/69.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඉංජිනේරු තනතුර

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය විසින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දින වලදී හෝ ඉන් පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

මෙරට ඉල්ලුම් පත්—1970 මාර්තු මස 31 වැනිදා.
විදේශීය ඉල්ලුම් පත්—1970 අප්‍රේල් මස 3 වැනිදා.

සටහන :—

(i) මුද්‍රිත ඉල්ලුම් පත් ආකෘති පත්‍ර තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙක්ද? නැද්ද? යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″—4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලද් ආවූද, මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පතක් හෝ ඊට අදාල ලිපියක් හෝ තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දින වන තුරු ඉල්ලුම් පත් ප්‍රමාද කරන ඉල්ලුම්කරුවන් එසේ කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි තමන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරට වල ඉල්ලුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත් පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබාගත හැක. සිය ඉල්ලුම් පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු වස් තමන් පදිංචි රටේ හෝ තමන් පදිංචි රටට ආසන්න රටේ හෝ ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට ඉල්ලුම්කරුවන්ට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු :** ලංකාණ්ඩුව යටතේ සේවයට පත් කිරීම සඳහා විදේශ වලින් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා අය කෙරෙන ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි:** මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. මෙම පත්වීම ප්‍රථම කොට අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වනු ඇත. තෝරා ගනු ලබන අයදුම්කරු රජයේ සේවකයෙකු වුවහොත්, නිශ්චිත කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත පත්වීම දෙනු ලැබේ.

**3. වැටුප් :**

මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—

(ඒ) රු. 9,600 හා රු. 13,920 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම්ද සහිතව වර්ෂයකට රු. 7,800—3 × 360—8,880/9,600—4 × 360 සහ 11 × 480—රු. 16,320 දක්වා,

(බී) රු. 13,440 වාර්ෂික වැටුප් පියවර ඉක්මවා යාමට සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් අවශ්‍ය වනු ඇත. මෙයද, කාර්යක්ෂමතා කඩඉමක් ලෙස සලකනු ලැබේ.

(සී) සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට රු. 9,960 ආරම්භක වාර්ෂික වැටුපක් හිමිවනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තව සිටින බව,

(බී) 1970 මාර්තු මස 31 වැනි දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 45ට නොවැඩි බව, (රජයේ සේවයේ නියුතු අයට මෙම වයස් සීමා බලනොපානු ඇත.)

(සී) (i) ලංකා විශ්ව විද්‍යාලයයේ ඉංජිනේරු උපාධියක් හෝ සමාන පිළිගත් උපාධියක් ලබා ඇති බව, නැතහොත්

(ii) (ලන්ඩන්හි) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ උපාධිධාරී සාමාජිකත්වය හෝ ලංකා ඉංජිනේරු ආයතනයේ යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා උපාධිධාරී සාමාජිකත්වය හෝ සමාන සුදුසුකමක් ඇති බව හෝ,

(iii) ලංකා ඉංජිනේරු ආයතනයේ අධි සාමාජිකත්වය (එෆ්. අයි. ඊ. ලංකා) හා සාමාජිකත්වය (එම්. අයි. ඊ. ලංකා) යන උපාධි ලබා ඇති බව හෝ සමාන සුදුසුකමක් හෝ ලබා ඇති බව.

5. ඉල්ලුම් කළ විට අපේක්ෂකයින් විසින් පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාඨශාලා සඳහා නියමිත ව්‍යවස්ථා අනුව නිකුත් කළ උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් පාඨශාලා අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහලෙන් සහ/හෝ දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැළකිය යුතුයි.

(i) ලියවිලි හෝ ඒවා වල පිටපත් හෝ ඉල්ලුම් පත්‍රයට නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ විට ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙරදී හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. ඉල්ලුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මෙම කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය පිළිපැදින්නා වූ ද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නා වූ ද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත්, අයදුම්කරු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මාර්තු මස 5 දින,
කොළඹ 1, ගාලු මුවදොර,
මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.
තැ. පෙ. 500.

**3–172/2—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය**

---

## ලංකා යුද්ධ හමුදාවේ නිලධාරී තනතුර

ලංකා යුද හමුදා කායර් සේවා ලංකා ඉංජිනේරු බලකායේ ආරක්ෂක සේනා ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ලබන අපේක්ෂකයන් ලංකා යුද හමුදාවේ දෙවැනි ලුතිනන් නිලයෙහි ස්ථිර අධිකාරී පත්වීම් පිරිනමනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරුවන් 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයන්හි නියම කර ඇති පරිදි ඔහුගේ නිලයට අනුකූල වූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ලුතිනන් කර්නල් නිලය දක්වා ගෙවනු ලබන මූලික වැටුප් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වේ :—

මේජර් නිලයට ඉහළ උසස් කිරීම් තේරීම් අනුව වේ.

දෙවැනි ලුතිනන්—වාර්ෂික වැටුප රු. 4,500.

ලුතිනන්—වාර්ෂික වැටුප රු. 4,860—රු. 180 වැඩිවීම් 2 සහ රු. 360 වැඩිවීම් 1—රු. 5,580.

කපිතන්—වාර්ෂික වැටුප රු. 6,660—රු. 180 වැඩිවීම් 6—රු. 7,740.

මේජර්—වාර්ෂික වැටුප රු. 8,820—රු. 180 වැඩිවීම් 6—රු. 9,900

ලුතිනන්-කර්නල්—වාර්ෂික වැටුප රු. 12,105—රු. 225 වැඩිවීම් 6—රු. 13,455.

(ආ) පහත සඳහන් පරිදි දීමනා ද ගෙවනු ලැබේ :—

(i) නිලධාරීන් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සලසා නොමැති නිලධාරීන්ට, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර, නේවාසිකාගාරයක ඉඩකඩ පහසුකම් ලබා දී ඇති නිලධාරීන්ට යුද හමුදා වියදමෙන් කෑම් බීම් සපයනු ලබන අතර, ඔවුන්ට මෙම දීමනා අහිමි වේ.

(ii) සේවා හෝ රජයේ විවාහක නිවාසයක් ලබා දී නොමැති විවාහක නිලධාරියකුටත් නේවාසිකාගාර ඉඩකඩ පහසුකම් හෝ ඔහුගේ පදවියට නියමිත විශේෂ නිවාසයක් ලබාදී නොමැති අවිවාහක නිලධාරියෙකුටත්, රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසරදී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව සහ නියමිත කොන්දේසි උඩ ගෙවල් කුලී දීමනා.

(iii) නේවාසිකාගාර තුළ වාසය කිරීමට අණ ලැබ, නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබ, යුද හමුදා වියදමෙන් කෑම් බීම් සපයනු ලබන කාල පරිච්ඡේදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24ක කාලයක් වෙනුවෙන් විවාහක නිලධාරියෙකුට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනා වන් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡේදයන් තුළ ජීවනාධාර විශේෂ ජීවනාධාර යැපීම් සහ වෙනත් නවාතැන් ගාස්තු ගෙවනු නොලැබේ.

(iv) රජයේ නිලධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසිවලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ.

(v) 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අතිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිල ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඇ) නිලධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :—

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුදා වැටුප් වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුදා මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(අ) **ජාතිය.**—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි ;

(ආ) **වයස.**—ඉල්ලුම්කරුවන් 1970 අප්‍රේල් 2 වැනි දිනට වයස අවුරුදු 28ට නොවැඩි විය යුතුයි ;

(ඇ) **අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.**—පහත සඳහන් සුදුසුකම් වලින් එකක් මවුනට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) ලන්ඩන් සිවිල් ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන විභාගයේ I වැනි II වැනි කොටස් වලින් සාමාර්ථය ලැබූ ; හෝ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංජිනේරු ශිල්පය පිළිබඳ පරීක්ෂණයේ I වැනි කොටසින් (ඒ සහ බී අංශයෙන්) සාමාර්ථය ලබා සහ උපාධි පාඨමාලාව සම්පූර්ණ කර අවසාන (සිවිල්) II වැනි කොටස සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලැබූ ; හෝ

(iii) ඒ. එම්. අයි. සී. ඊ. විභාගයේ I වැනි කොටසින් (ඒ සහ බී අංශයෙන්) සාමාර්ථය ලබා පුහුණුවීමේ පාඨමාලාවන් සම්පූර්ණකර ඒ. එම්. අයි. සී. ඊ. විභාගයේ II වැනි කොටසට පෙනී සිටීම සඳහා පිළිගනු ලැබූ ; හෝ

(iv) සහකාර ඉංජිනේරුවන් වශයෙන් උසස් කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන පරීක්ෂණය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අය ; හෝ

(v) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ " සිවිල් " පාඨමාලාවෙන් සාමාර්ථය ලබා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ විශාල ඉංජිනේරු සමාගමක තුන් අවුරුදු කාලයකට නොඅඩු ප්‍රායෝගික පළපුරුද්ද ඇති අය.

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයදුම්කරුවන් යුද හමුදාවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතුයි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම්පත් තම අත් අකුරින් විය යුතු අතර, 1970 අප්‍රේල් 2 වැනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුදා මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම්පත් බහා ලන කවරයෙහි " ආරක්ෂක සේනා ඉන්ජිනේරු තනතුර සඳහා ඉල්ලුම්පත " යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරන නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිලධාරියෙකු තෝරාපත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුදා විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑතදී ලබාගත් ඒවා විය යුතුය.

8. ලැබෙන ඉල්ලුම්පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරාපත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවන්ට, එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අතිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම්කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරභයා දැනටමත් පනවා ඇති හෝ මින් පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දායක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩු කර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයන් විසින් දිය යුත්තේය.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුධ හමුදා ආඥාපති වෙනුවට.

1970 මාර්තු මස 2 වැනි දින.

**ලංකා යුද්ධ හමුදා කාර්ය සේවා ලංකා ඉන්ජිනේරු බලකායේ ආරක්ෂක සේනා ඉන්ජිනේරු තනතුර සඳහා ඉල්ලුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය : (ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න.) :————.

3. ලිපිනය :—

කාර්යාලයේ :————.

වාසස්ථානයේ :————.

4. උපන් දිනය (1970. 4. 2 වැනි දිනට වයස) :—
අවුරුදු :———, මාස :———, දින :———.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය, සහ දැන් ලිපිනය :————.

මවගේ :————.

පියාගේ :————.

6. ඔබ විවාහකද ? අවිවාහකද ? :————.

7 පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය බට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11 මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කොළෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? :————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :————.

පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.

ඇතුල්වූ දිනය :————.

අස් වූ දිනය :————.

සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—

ස්වාමි පක්ෂය :————.

රැකියාවේ ස්වභාවය :————.

සේවය කළ කාලය :——. දින සිට :—— දින දක්වා.

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–126—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### විධායක තනතුරු

සමුපකාර තොග වෙළඳ සංස්ථාව, එහි විධායක ශ්‍රේණියේ ඇබෑර්තු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවයි.

1. තෝරාගනු ලබන අයදුම්කරුවන් කොළඹ සහ පිට පළාත්වල විශාල දෙපාර්තමේන්තු හෝ ගබඩා සමූහයන් භාරව පරිපාලක තත්ත්වයක තබනු ලබන අතර, ඒවායේ සංවිධානය, කළමනාකාරීත්වය හා පාලනය ගැන ඔවුන් වගකියනු ඇත.

2. අයදුම්කරුවනට පහත සඳහන් අඩුම සුදුසුකම් තිබිය යුතුය :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් විය යුතු ය.

(ii) රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරීන් වශයෙන් හෝ විශාල වානිජ ආයතනවල ජ්‍යෙෂ්ඨ විධායකයන් වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් ඔවුනට තිබිය යුතු ය.

(iii) 1970. 3. 1 දිනට වයසින් අවුරුදු 40 නොඉක්ම වූ අය විය යුතු ය.

3. රු. 1,000—රු. 50×10—රු. 1,500යේ වැටුප් හිණක් මෙම තනතුරු වලට හිමිවන අතර, තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව එම වැටුප් හිණේ කිසියම් පියවරක තැබිය හැකි ය.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන් ස්වකීය වැටුපෙන් සියයට 10 බැගින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය; පාලක පක්ෂය විසින් ගෙවනු ලබන දායක මුදල වැටුපෙන් සියයට 15කි.

රජයේ හෝ රජයේ සංස්ථාවල සේවයේ යෙදී සිටින අය විසින් එවනු ලබන අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතු වේ; එහෙත් ඒවා සලකා බලනු ලබන්නේ, පත්වීම් සඳහා ඔවුන් තෝරාගනු ලැබුවහොත් මුදා හැරීමට එකී ආයතන ප්‍රධානීන් එකඟවන්නේ නම් පමණි.

සුදුසුකම්, පළපුරුද්ද යනාදිය පිළිබඳ විස්තර ඇතුළත් අයදුම්පත් 1970. 3. 20 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ තැන, ස. තො. ස. සේවක මණ්ඩල කළමනාකරු වෙත ලැබෙන සේ එවිය යුතු ය :—

සේවක මණ්ඩල කළමනාකරු.

ස. තො. ස. ප්‍රධාන කාර්යාලය,
21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2,
1970 පෙබරවාරි මස 26 දින.

3–88—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

### පුරප්පාඩුව

මෙම සංස්ථාවට අයත් සපුගස්කන්දෙහි පිහිටි තෙල් පිරිපහදු අංශයෙහි පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද ආදී සියලුම විස්තර ඇතුළත් කොට පිළියෙල කරන ලද අයදුම් පත් 1970 මාර්තු මස 23 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ

සේවක මණ්ඩල කළමනාකාර තැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලුපාර,
කොළඹ 3.

යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි “ හෙසජ්ජක තනතුර ” යනුවෙන් සඳහන් කොට එවිය යුතුයි.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයක් මත පත් කිරීමට ඉඩ ඇත.

4. මෙහි පහත දක්වා ඇති වැටුප් පරිමාණය ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් වේ.

5. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම්පත් කිසිදු දැක්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. ඉල්ලුම්පත්‍ර ලැබුණු බවද දන්වනු නොලැබේ.

7. රජයේ දෙපාර්තමේන්තුවල/හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදාල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාගීයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.8.20 වෙනි දින දරණ චක්‍රලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිලධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකිදැයි යන්න දෙපාතීමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

8. සේවා කොන්දේසි :

(i) තෝරාගනු ලබන අයදුම්කරුවන්—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දැක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ශ්‍රේණියේ සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීනත්වයක් ලබා ගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට දහය (10%) ක් දායක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට පහළොව (15%) ක් දායක වනු ඇත.

(ඊ) සංස්ථාවේ ඕනෑම කාර්යාංශයක් යටතේ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීම අවශ්‍යය.

(ii) මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

| 9. තනතුර හා වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| හෙසජ්ජක<br>රු. 390—630<br>8×15 ; 6×20 | (අ) අවුරුදු පහක අඛන්ඩ පළපුරුද්දක් ඇති, සුදුසුකම් ලත් පිරිමි හෙසජ්ජකයින් විය යුතු අතර, ඔවුන් ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූවන් විය යුතුය.<br>(ආ) වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. |

113, ගාලු පාර,
කොළඹ 3.

සේවක මණ්ඩල කළමනාකාර තැන.

3–169—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ලංකා ප්‍රමිති කාර්යාංශය

### විධායක පුරප්පාඩු

**ගණක නිලධාරි—වයස :** අවුරුදු 35 ට නොවැඩි නම් මැනවි.

**සුදුසුකම් :**

(i) වරලත් ගණකාධිකාරින් ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය

හෝ

(ii) පිරිවැය ගණකාධිකාරීන් ගේ ආයතනයේ I, II සහ III කොටස් සමත් වීම

හෝ

(iii) සහතික කරන ලද හා ව්‍යවස්ථාපිත ගණකාධිකාරීන් ගේ ආයතනයේ I, II සහ III කොටස් සමත් වීම

හෝ

(iv) ලංකා කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය සහ එම සහතිකය ලැබීමෙන් පසු අවුරුදු 2 ක පළපුරුද්ද.

**වැටුප් ක්‍රමය :**

(අ) රු. 600—10×40—රු. 1000. (සියල්ල අඩංගු මාසික).

(ආ) රු 800—5×40 : 5×50—රු. 1250 (සියල්ල අඩංගු මාසික).

**සැලකිය යුතුයි.**—ඉහත කී (i), (ii) සහ (iii) සඳහන් විභාග සමත්වීමෙන් පසු අවුරුදු 3 ක පළපුරුද්දක් නොමැති අය (අ) වැටුප් ක්‍රමය මත බඳවා ගනු ලබන අතර, වෘත්තීය සුදුසුකම් ලබා අවුරුදු 3 ක් ගතවීමෙන් පසු (ආ) වැටුප් ක්‍රමය මත තැබීමට උචිතකම් ලබයි. වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 3 ක පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙළින්ම (ආ) වැටුප් ක්‍රමය මත බඳවා ගනු ලැබේ.

ලංකා කාර්මික විද්‍යාලයේ ඩිප්ලෝමා සහතිකය සහ එම සහතිකය ලැබීමෙන් පසු අවුරුදු 5 කට අඩු පළපුරුද්දක් ඇති අය (අ) වැටුප් ක්‍රමය මත බඳවා ගනු ලබන අතර සහතිකය ලබා අවුරුදු 5 ක් ගත වීමෙන් පසු (ආ) වැටුප් ක්‍රමය මත තැබීමට උචිතකම ලබයි. ඩිප්ලෝමා සහතිකය ලැබීමෙන් පසු අවුරුදු 5 ක පළපුරුද්ද ඇති අය කෙළින්ම (ආ) වැටුප් ක්‍රමය මත බඳවා ගනු ලැබේ.

අවශ්‍ය අඩු ම සුදුසුකම්වලට වඩා වැඩි සුදුසුකම් ඇති අයට බඳවා ගනු ලබන අවස්ථාවේ දී අදාළ වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තැබීමට උචිතකම් ඇත.

**සංඛ්‍යාන නිලධාරි—වයස.**—අවුරුදු 35 ට නොඅඩු නම් මැනවි.

**සුදුසුකම් :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ ගෞරව සහිත ගණිතය පිළිබඳ විශේෂ උපාධියක්

හෝ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ හෝ ගෞරව සහිත භෞතික විද්‍යාව හා ගණිතය සහිත සාමාන්‍ය උපාධිය.

**වැටුප් ක්‍රමය :**

(අ) රු. 600—10×40—රු. 1000 (සියල්ල අඩංගු මාසික).

(ආ) රු. 800—5×40 : 5×50—රු. 1250 (සියල්ල අඩංගු මාසික).

පළමුවෙන් බඳවා ගැනීම් කරනු ලබන්නේ (අ) වැටුප් ක්‍රමය මතය. බඳවා ගනු ලබන අය (අ) වැටුප් ක්‍රමය මත අවුරුදු 3 ක ආධුනික කාලය සතුටුදායක ලෙස නිම කිරීමෙන් පසු (ආ) වැටුප් ක්‍රමය මත තැබීමට උචිතකම් ලබයි.

### පොදු කොන්දේසි

(1) අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතු ය.

(2) අර්ථසාධක අරමුදලට දායකවීම.—සියයට 4ක් නිලධාරියාගෙන් හා සියයට 6 ක් ලංකා ප්‍රමිති කාර්යාංශයෙන්.

(3) මෙම දැන්වීමේ සඳහන් ආදර්ශ අයැදුම් පත්‍රය අනුව අයදුම් පත්‍ර සකස් කළ යුතුවේ. අයැදුම් පත්‍රය සමග සහතික පත් වල පිටපත් (මුල් පිටපත් නොව) එවිය යුතු ය.

(4) තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පවත්නා සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතු ය.

(5) තෝරා ගන්නා අපේක්ෂකයෝ අවුරුදු 3ක ආධුනික කාලය කට යටත් ය.

(6) රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල හෝ සිටින නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල හෝ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතු අතර ඔවුන් තෝරා ගැණුනහොත් නිදහස් කිරීමට එකඟ දැයි දැන්විය යුතු ය.

7. අයදුම් පත්‍රයේ අසත්‍ය දේ ප්‍රකාශ කර, එම අසත්‍ය ප්‍රකාශයන් තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් අයැදුම්කරු නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරාගනු ලැබුවාට පසු අයැදුම් පත්‍රයේ ප්‍රකාශ කර ඇති දේ අසත්‍ය බවට සොයා ගනු ලැබුවහොත් අයැදුම් කරු සේවයෙන් පහ කරනු ඇත.

(8) මෙම දැන්වීමේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නැති සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

(9) අයැදුම් පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ඉල්ලුම් කරන නිලය සඳහන් කළ යුතු වේ.

(10) ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු නො ලැබේ.

(11) ඉල්ලුම් පත්‍ර 1970 මාර්තු 31 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, ලංකා ප්‍රමිති කාර්යාංශය, 53, ධර්මපාල මාවත, කොළඹ 3 වෙත **ලියා පදිංචි කළ තැපැලෙන්** එවිය යුතු වේ.

අධ්‍යක්ෂ,
ලංකා ප්‍රමිති කාර්යාංශය.

### ආදර්ශ අයදුම් පත්‍රය

### ලංකා ප්‍රමිති කාර්යාංශයේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) ඉල්ලුම් කරන තනතුර :————.

(2) සම්පූර්ණ නම (වාසගම මුලට) :————.

(3) ලිපිනය :————.

(4) උපන් දිනය :————.

(5) ජාතිය :————.

(6) සුදුසුකම් :—

(අ) ශාස්ත්‍රාලයීය (විෂයයන් සමග) :————.

(ආ) වෘත්තීය :————.

(7) පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් හෝ අස්වීමෙන් පසු කළ රක්ෂා දින සහිතව (දැරූ නිල සහ ලැබූ වැටුප් පිළිබඳ විස්තර දිය යුතුයි) :————.

(8) පළපුරුද්ද :————.

(9) විශේෂ සුදුසුකම් :————.

(10) සිංහල ප්‍රවීණතාව :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති සියලු ම විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන් ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් නුසුදුස්සෙකු වන බව ද තෝරා ගනු ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව සොයා ගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ඉඩ ඇති බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–83—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

### නීති සහායක තනතුර

ඉහත කී තනතුර සඳහා, 1970 මාර්තු 26 වැනි දිනට වයස අවුරුදු 23 ට නොඅඩු සහ අවුරුදු 28 ට නොවැඩි පෙරකදෝරු මහතුන් ගෙන්, 1970 මාර්තු 26 වැනි දින දක්වා ආයතනය විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මාසික මූලික වැටුප් පරිමාණය රු. 460 සිට රු. 940 දක්වාය. ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ විස්තර කොළඹ 3, තැපැල් පෙට්ටිය 20, කායසීල සහායක ගෙන් ලබාගත හැක. විස්තර සඳහා කරන සෑම ලිඛිත ඉල්ලීමක් සමගම තමන්ගේ ලිපිනය සඳහන් මුද්‍රිත 9″×4″ ලියුම් කවරයක් ද එවිය යුතුය.

සාමාන්‍යාධිකාරී.

1970 පෙබරවාරි 25 වැනිදා.

3–145—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි පරිපාලක තනතුරු

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිපාලක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. යට දැක්වෙන ආකෘතියේ පරිදි පිළියෙල කරන ලද අයදුම්පත්, 1970 අප්‍රේල් මස 16 වන දින හෝ ඊට ප්‍රථම කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය.

2. තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය වාර්ෂිකව රුපියල් 4, 152—16×144—රුපියල් 6,456 වේ. (වාර්ෂික රුපියල් 5,304 වැටුප් තලයට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

3. **අවශ්‍ය සුදුසුකම් :**

(ඒ) **වයස.**—1970.4.16 වන දිනට වයස අවුරුදු 20 ට නොඅඩු හෝ අවුරුදු 35 ට නොවැඩි වූ,

**සහ**

(බී) **අධ්‍යාපනික.**—ගණිතය ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් පහක්වත් එකම විභාග අවස්ථාවකදී ලත් සාමාර්ථය සහිතව විෂයයන් හයකින් ලත් සාමාර්ථය හෝ ගණිතය ඇතුළුව ඊට සමාන වූ හෝ උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබා තිබීම,

**සහ**

(සී) **කාර්මික.**—පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම :—

(i) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාගයේදී 1 වන ශ්‍රේණියේ උප පරීක්ෂකවරුන්ගේ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම—1 වන උප ග්‍රන්ථය බලන්න.

**හෝ**

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම, යාන්ත්‍රික නිර්මාන ශිල්පය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව සම්පූර්ණ පාඨම් මාලාව සාර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කිරීම,

**හෝ**

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය සඳහා වූ සම්පූර්ණ දිවාකාල පාඨම් මාලාව සාර්ථක ලෙස නිමකර තිබීම,

**හෝ**

(iv) ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික අභ්‍යාස ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ලෙස නිමකොට තිබීම,

**සහ**

(ඩී) පළපුරුද්ද.—ගොඩනැගිලි ඉදිකිරීම, හෝ සාමාන්‍ය සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු පහක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම.

4. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති සහ කොන්දේසි.**—තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම පළමුවෙන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් වන්නේය. පත්කරනු ලබන අය නියම කරනු ලබන පරිද්දෙන් දිවයිනේ කවර ස්ථානයක වුවද සේවය කළ යුතුවේ.

5. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළයුතු අතර, තෝරාගත හොත් ඔවුන් දැනට දරණ තනතුරුවලින් මුදාලිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සටහනක් ඇති අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

7. අයදුම්කරුවෝ තම අයදුම්පත් වලට පහත දැක්වෙන සහතිකයන්හි පිටපත් (මුදල් සහතික නොවේ.) ඇමිණිය යුත්තාහ :—

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(iii) දැන්වීමේ 3 (සී) ඡේදය යටතේ කාර්මික සුදුසුකම් පිළිබඳව ලබා ඇති සහතිකය.

(iv) දැන්වීමේ 3(ඩී) ඡේදය යටතේ පස් අවුරුද්දක පළපුරුද්දක් තිබෙන බවට සහතිකය.

(v) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් මේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.

8. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය පසුවී මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

අමරදාස ගුණවර්ධන,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1970 මාර්තු 4 වන දින.

### 1 වන උප ග්‍රන්ථය

**1 වන ශ්‍රේණියේ උප පරීක්ෂක වරුන්ගේ යෝග්‍යතා පරීක්ෂණයේ නිර්දේශ පත්‍රය**

| විෂයය | | කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතික විභාගයේ විෂයය අංකය |
|---|---|---|
| 1. අංක ගණිතය හා වීජ ගණිතය | ... | 1 |
| 2. ජ්‍යාමිතිය ... ... | ... | 2 |
| 3. ප්‍රමාණයන් ගණන් ගැනීම ... | ... | 3 |
| 4. මැනීම හා මට්ටම් ගැනීම ... | ... | 4 |
| 5. සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම | ... | 5 |
| මීට අමතරව පහත සඳහන් විෂයයන්ගෙන් දෙකක් :— | | |
| 6. වැඩපොල ප්‍රහුණුව ... | ... | 6 |
| 7. මූලික ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව | ... | 7 |
| 8. පාරවල් තැනීම හා නඩත්තුව ... | ... | 8 |
| 9. ජල සම්පාදනය හා ජල පවාහනය | ... | 9 |

**ආදර්ශ අයදුම් පත්‍රය**

### ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිපාලක තනතුර

1. සම්පූර්ණ නම :————.
පෙළපත් නාමය :————.
අනික් නාමයන් :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4. 1970 අප්‍රේල් 16 වන දිනට වයස :————.

5. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

6. අධ්‍යාපන සුදුසුකම් :————.
සමර්ථ වූ ප්‍රසිද්ධ විභාගයන්ගේ දිනයන් සහ සමත්වූ විෂයයන් (ඉහළම විභාගයේ සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය.)

7. දැන්වීමේ 3 (සී) ඡේදය යටතේ දැක්වෙන කාර්මික සහතික වලින් ඔබ ලබා ඇති සහතිකය කුමක්දැයි සඳහන් කරන්න. (සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

8. දන්වීමේ 3 (ඕ) ඡේදය යටතේ ඔබ සතු පළපුරුද්ද සඳහන් කරන්න. (සහතිකයක් ඇමිණිය යුතුය) :————.

9. චරිත සහතික ලබාගන්නා ලද්දවුන්ගේ ලිපිනයන් (සහතික යන්හි පිටපත් ඇමිණිය යුතුය.) :————.

10. දනට කරන රක්ෂාව හා වැටුප :————.

11. විශේෂ සුදුසුකමක් ඇතොත් සඳහන් කරන්න :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව, මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත්, මේ පදවියට මා පත්වීමට නුසුදුසු වන බැව් හා පත්වීමෙන් පසු අසත්‍යභාවයක් ඔප්පු වුවහොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමටද හේතුවන බැව් හොඳාකාර මම දන්නා බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–124—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### පුරප්පාඩු

කැළණියේ සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙහි නියෝජ්‍ය තෙල් පිරිපහදු කළමනාකාර තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයැදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. අයදුම්කරුවන්.—(i) රසායනික හෝ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳව විශ්ව විද්‍යාලයීය පශ්චාත් උපාධියක් හෝ උපාධියක් සමග අදල ඉංජිනේරු ආයතනයක ආශ්‍රිත හෝ පූර්ණ සාමාජිකත්වය සහ ;

(ii) පශ්චාත් උපාධිය ලැබීමෙන් පසු හෝ වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 10 ක පලපුරුද්දක් ලබා තිබිය යුතුය.

ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය හා සම්බන්ධ ඉංජිනේරු හෝ කාර්මික විද්‍යා කටයුතු පිළිබඳ පූර්ව පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

(iii) වයස අවුරුදු 35 ටත් 50 ටත් අතර විය යුතුය.

3. තෝරාගනු ලබන අයදුම්කරුට ඛනිජ තෙල් පිරිපහදු හා එම කාර්ය හා සම්බන්ධ කාර්මික විද්‍යාව පිළිබඳව අවුරුදු 2 ක පුහුණුවක් දීමෙන් පසු තෙල් පිරිපහදු කළමනාකාර තනතුරට පත් කිරීම ගැන සලකා බලනු ලැබේ.

4. මෙම තනතුරට හිමි මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. $\frac{2,750—3,250}{4\times 75 \; : \; 2\times 100}$ කි· කෙසේ වුවද ඉල්ලුම්කරුට තම තනතුර භාර ගැනී ාමදී ලැබීමට බලාපොරොත්තු වන අවම වැටුප කොපමණදැයි සඳහන් කළහැක.

5. සවිස්තරව කරුණු දක්වෙන සේ පිළියෙල කළ ඉල්ලුම් පත්‍ර (සහතික කිසිවක් අමුණා එවිය යුතු නොවේ.) 1970 අප්‍රේල් මස 10 වන දිනට පෙර,
සභාපති,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
113, ගාළුපාර,
කොළඹ 3, යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තුවල හෝ රජයේ අනෙක් සංස්ථාවන්හි හෝ සේවකයින් විසින් එවනු ලබන අයදුම්පත් සලකා බලනුයේ, ඔවුන් විසින් ඒවා අදල දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි. භාණ්ඩාගාරයේ අංක 666 හා 1965.8.20 වෙනි දින දරණ චක්‍ර ලේඛයෙහි දක්වෙන වගන්තිවලට අනුව අදල නිළධාරියා සිය සේවයෙන් නිදහස් කළ හැකි දැයි යන්න දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

7. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවුනු ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9. සේවා කොන්දේසි.—(1) තෝරාගනු ලබන අයදුම්කරුවන්—

(අ) පත්වීමට පෙර ශාරීරික යෝග්‍යතාව දක්වීම සඳහා වෛද්‍ය පරීක්ෂණ යකින් සමත්විය යුතුය.

(ආ) ආධුනික කාලය තුළ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමවස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන ප්‍රමාණයක සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඉ) සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට දහය (10%) ක් දයක විය යුතුය. ඊට සංස්ථාවෙන් සියයට පහළොව (15%) ක් දයක වනු ඇත.

(ඊ) මෙම තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්ව පත්කරනු ලැබේ.

සේවක මණ්ඩල කළමනාකාරතැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

113, ගාලු පාර,
කොළඹ 3.

3–170/1—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

මෙම සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මෙහි අවසානයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1970 මාර්තු මස 19 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ,

සේවක මණ්ඩල කළමනාකාරතැන,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 113, ගාලුපාර,
කොළඹ 3, යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

3. මෙම දැන්වීමෙහි සඳහන් අවශ්‍යතාවයනට අනුකූලව පිළියෙල නොවන ඉල්ලුම් පත් කිසිදු දැන්වීමක් නොකර ප්‍රතික්ෂෙප කරනු ලබන අතර, ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන්, ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව සුදුසු වැටුප් ලක්ෂ්‍යයක් මත පත් කිරීමට ඉඩ ඇත.

| තනතුර හා වැටුප් පරිමාණය | අවශ්‍ය සුදුසුකම් |
|---|---|
| වැද්දුම්කරු (තොග නිෂ්පාදන උපකරණ) සී-2 ශ්‍රෙණිය<br>රු. $\frac{190—290}{5\times 6 \; : \; 7\times 10}$ | (අ) කියවීමට හා ලිවීමට හැකියාවක් තිබිය යුතුයි.<br>(ආ) මෙම වෘත්තියේ යටත්පිරිසෙයින් අවු. 10 ක වත් පළපුරුද්දක් තිබිය යුතුයි.<br>(ඇ) "මයික්‍රෝ මීටරයක්" කියවීමට සහ දශමයක් වාර්තා කර ගැනීමට හැකි විය යුතුයි.<br>(ඈ) ඛනිජ තෙල් යන්ත්‍රෝපකරණ ක්‍රියා කිරීමේ මූලික ක්‍රමයන් සම්බන්ධව සෑහෙන දැනීමක් ද එවැනි උපකරණ වල වැරදි සොයා ප්‍රතිකර්ම යෙදීමටද හැකිවිය යුතුයි.<br>(ඉ) එවැනි වැඩට අදල ඉරි සටහන් තේරුම් ගැනීමට සහ කියවීමට හැකි විය යුතුයි.<br>(ඊ) නිෂ්පාදන පොම්ප, අඟල් 12 හේ විෂ්කම්භය ඇති නල මාර්ග සවිකිරීම සහ අළුත්වැඩියා කිරීම ගැන මනා දැනීමක් තිබිය යුතුයි.<br>ඛනිජ තෙල් කර්මාන්තය සඳහා පාවිච්චි කරනු ලබන නොයෙකුත් වර්ගවල වැල්ව (වැල්වස්) අළුත් වැඩියා කිරීමට හැකිවිය යුතුයි. |

සේවක මණ්ඩල කළමනාකාරතැන.

113, ගාලු පාර,
කොළඹ 3,
1970 පෙබරවාරි මස 26 වෙනි දින.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

1. ඉල්ලුම් කරන ලද තනතුර :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙලපත් නාමය ප්‍රථමයෙන් :————
3. මුල් අකුරු සමග නම :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
6. ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස —
අවුරුදු :————, මාස :————, දින :————.

7. පුරවැසි භාවය (උත්පත්තියෙන්ද, ලියාපදිංචිවීමෙන්ද යන වග) :————.

8. විවාහක/අවිවාහක බව —අවිවාහක බව :————, විවාහක බව :————, දික්කසාද බව :————.

9. අධ්‍යාපනික පසුබිම —

| ඉගෙනීම ලැබූ පාඨශාලාවල් | සාමාර්ථය ලැබූ උසස්ම විභාගයන් සහ වර්ෂයන් | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|---|
| ———— | ———— | ——— | ——— | ——— |
| ———— | ———— | ——— | ——— | ——— |
| ———— | ———— | ——— | ——— | ——— |

10. වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් තිබේ නම් :————.

11. මීට ප්‍රථම කරනලද රැකියාවන් පිළිබඳ විස්තර —

| ආයතනයේ නම | තත්වය | සිට | දක්වා | අස්වීමට හේතු |
|---|---|---|---|---|
| ———— | ———— | ——— | ——— | ———— |
| ———— | ———— | ——— | ——— | ———— |
| ———— | ———— | ——— | ——— | ———— |
| ———— | ———— | ——— | ——— | ———— |

12. දිනට ලබන වැටුප :————.

13. විශේෂ සුදුසුකම් ඇත්නම් (ඔබ විසින් හදරා ඇති ඉගෙනීම/පුහුණුව පිළිබඳ විස්තර සඳහන් කරන්න) :————.

14. වෙනත් කරුණු :————.

15. මෙම දැන්වීමේ තනතුරු සඳහා ''අවශ්‍ය සුදුසුකම්'' යටතේ සඳහන් සුදුසුකම්/පළපුරුදුකම් එකිනෙක ඔබට ඇති බව දක්වෙන සටහනක් හා එය ඔප්පු කිරීම සඳහා අදල සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර සියල්ල නිවැරදි බවත්, සත්‍ය බවත්, සඳහන් කළයුතු කිසිවක් වසන් නොකළ බවත් මෙයින් සහතික කරමි. ඉහත සඳහන් විස්තර අසත්‍ය බව හෝ සැපයිය යුතුව තිබූ විස්තර වසන් කර ඇති බව හෝ තෝරා පත්කර ගැනීමට පෙර ඔප්පු වුනිනම් මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වන බවද තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුනිනම් කිසිම වන්දියක් නොමැතිව රැකියාවෙන් පහකරනු ලබන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–170/2—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාර අංකය : 1/10/1 (ජී)

1955 ඔක්තෝබර් 1 වැනි දින අංක 10,844 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කර ඇති සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වෘතීවේ 5(II) වැනි ඡේදය යටතේ පහත සඳහන් නිලධාරීන් සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකරු පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරා ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| අත්තනායක, වී. | ... | මහා මාර්ග දෙපාර්තමේන්තුව. |
| අම්පලවානර්, සු. | ... | වරාය කොමිසම. |
| අලගරත්නම්, මු. | ... | ආහාර. |
| අලහේන්ද්‍ර, දො. ක. | ... | ජනසතු සේවා අමාත්‍යාංශය. |
| ඉලුක්කුඹුර, ඒ. | ... | අධ්‍යාපන, ගම්පහ. |
| එක්නැලිගොඩ, එ. ව. | ... | මහා මාර්ග. |
| ඔකර්ස්, ඇ. | ... | මඩකලපුව කච්චේරිය. |
| කනගසභාපති, සේ. | ... | වව්නියාව කච්චේරිය. |
| කනපතිපිල්ලේ, සී. | ... | පිස්කල් කාර්යාලය, යාපනය. |
| කයිලේස්වරන්, ක. | ... | සමූපකාර. |
| කල්දේරා, වෙ. රෝ. | ... | විදුලි. |
| කාහින්ගල, ඒ. | ... | මහා භාණ්ඩාගාරය. |
| කුමාරපිල්ලෙයි, ඉ. වා. | ... | කම්කරු. |
| කුලතුංග, ප්‍ර. | ... | මාතර මහෙස්ත්‍රාත් උසාවිය. |
| කුලතුංග, වි. මු. ගු. | ... | ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශය. |
| කෘස් ක්‍රි. ජේ. | ... | වරාය කොමිසම. |
| ගුණරත්න, ග. හ. ද. සි. | ... | ඉඩම් සංවර්ධන. |
| ගුණසේකර ආ. ඩ. | ... | පොලිස්. |
| ගුණසේකර, නා. ආ. සු. ඩ. | ... | අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය. |
| ගුරුගේ, ඇ. | ... | ගාල්ල කච්චේරිය. |
| චෙල්ලරාජා, වෙ. | ... | රාජ්‍ය දැව සංස්ථාව. |
| ජයවර්ධන, ජෝ. සො. කු. ද. සි. ව. | ... | දේශීය ආදායම්. |
| ජේයිමන්, මු. ත. | ... | මහා මාර්ග. |
| ඩයස්, පී. ඔ. ලී. | ... | මාතර දිස්ත්‍රික් උසාවිය. |
| තම්බිරාජා, න. | ... | මඩකලපුව කච්චේරිය. |
| තිරුනාවකරසු, සී. | ... | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත. |
| ද සිල්වා, ගො. ගු. | ... | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| ද සිල්වා, ම. කු. නී. | ... | ගොඩනැගිලි. |
| ද සිල්වා, වි. රෙ. | ... | ගුරු වැ. අ. වි. වැ. කාර්යාලය. |
| දිසානායක, ම. කු. පි. නි. | ... | රෙජිස්ට්‍රාර් ජනරාල්. |
| දෙඩන්වල පි. බ. | ... | කෘෂිකර්ම. |
| නඩරාසා, මු. ච. | ... | මුලතිව් ගම්බද උසාවිය. |
| නාකන්දල, චා. පෙ. | ... | මෝටර් රථ ප්‍රවාහණ. |
| නාගලිංගම්, සු. | ... | පුත්තලම දිස්ත්‍රික් උසාවිය. |
| පත්මනාතන්, ක. | ... | මහා මාර්ග. |
| පියතිස්ස, න. හැ. | ... | සෞඛ්‍ය. |
| පියසේන, ඩෙ. චි. | ... | කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය. |
| පෙරේරා, කු. නි. | ... | කාලගුණ විද්‍යා. |
| පෙරේරා, ජෝ. | ... | පොලිස්. |
| පෙරේරා, දෙ. මැ. | ... | කොළඹ කච්චේරිය. |
| පෙරේරා, මී. වෝ. | ... | මොණරාගල කච්චේරිය. |
| පෙරේරා, හෙ. ක. ස. | ... | බස්නාහිර පළාතේ පිස්කල්. |
| පෙරේරා, හෙ. දෙ. හ. ඩැ. ලෙ. | | වරාය කොමිසම. |
| පොන්නුදුරෙයි, සී. | ... | ගණන් පරීක්ෂණ. |
| ප්‍රනාන්දු, අ. තො. ක්වි. | ... | අලෙවි. |
| ප්‍රනාන්දු, කු. එ. | ... | දේශීය ආදායම්. |
| ප්‍රනාන්දු, කු. ජෝ. වෝ. | ... | සෞඛ්‍ය. |
| ප්‍රනාන්දු, ම. ක්ලේ. වෙ. | ... | සෞඛ්‍ය. |
| ප්‍රනාන්දු, ලි. ලෝ. ඒ. | ... | කුරුණෑගල කච්චේරිය. |
| මානික්කවාසගර්, පො. | ... | සමාජ සේවා. |
| රණවීර, දො. ජේ. ද. සී. | ... | කළුතර මහෙස්ත්‍රාත් උසාවිය. |
| රණසිංහ, නි. | ... | දේශීය ආදායම්. |
| රත්තිනම්, ස. වෛ. | ... | ගණන් පරීක්ෂණ. |
| රත්නසභාපති, න. | ... | යාපනය කච්චේරිය. |
| රාජකරුණා, රා. ලි. අ. න. | ... | සිවිල් ගුවන් සේවා. |
| රාජපක්ෂ, ඒ. | ... | වාරිමාර්ග. |
| රුද්‍රාමූර්ති, සී. | ... | ගොවිජන සේවා. |
| වර්ණකුල, දො. ජු. | ... | අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය. |
| වික්‍රමනායක, ගො. වො. | ... | කළුතර දිස්ත්‍රික් උසාවිය. |
| විජේගුණතිලක, තෝ. හෙ. පී. | ... | කොළඹ දිස්ත්‍රික් උසාවිය. |
| විජේතුංග, සැ. තෝ. | ... | වාරිමාර්ග. |
| විජේසේකර, ලෝ. | ... | පළාත් පාලන අමාත්‍යාංශය. |
| විතානපතිරණ, ස. පෙ. | ... | ගොවිජන සේවා. |
| වීරසිංහ, ප. බෙ. | ... | ඉඩම් සංවර්ධන. |
| වේතමානික්කම්, වි. හෙ. ඩැ. | ... | දේශීය ආදායම්. |
| සිරිවර්ධන, ජ. මු. දො. සො. අ. | | මිනුවන්ගොඩ ගම්බද උසාවිය. |

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| සිරිවර්ධන, ස. ච. ද. සො. | ... | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන. |
| සිවනඩියන්, තු. | ... | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත. |
| සිවපාතසේගරම්, සි. | ... | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| සිවසුබ්‍රමනියම්, සෙ. | ... | මහාමාර්ග. |
| සුප්පිරමනියම්, සෙ. | ... | ගණන් පරීක්ෂණ. |
| සෙබස්තියන්පිල්ලෙයි, ජෝ. සි. | | ආහාර. |
| සෙල්ලදුරෙයි, ක. | ... | කෑගල්ල කච්චේරිය. |
| සෙල්වදුරෙයි, ඒ. | ... | අධ්‍යාපන, යාපනය. |
| හියුබට්, ඒ. ර. | ... | සිවිල් ගුවන් සේවා. |
| හුසේන්, න. මී. මො. | ... | කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය. |
| හෙන්රිකස්, ස. බ. | ... | සෞඛ්‍ය. |

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

3–90—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : 327/432.

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 අප්‍රේල් 19 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|---|
| | | රු. ශ. |
| (1) කුරුණෑගල ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ විල්ගොඩ වත්ත, ජනපද පාර තැනීම | ... | 20,000.00 |
| (2) පොල්ගහවෙල ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ වීරාගල කොලනි පාර තැනීම | ... | 20,000.00 |
| (3) පොල්ගහවෙල ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ බූස්නා පහුව කොලනි පාර තැනීම | ... | 20,000.00 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අයට 1970 අප්‍රේල් මස 16 වෙනි දින දහවල් 10.30 වනතෙක් කුරුණෑගල දිසාපති කාර්යාලයේදි ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ අදාල වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද, එක් එක් වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේනම්, මෙහි වැඩ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණකර, පිටපත් දෙකකින් යුතුව ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙලවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝරම තැපැලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ, අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

5. 1970 අප්‍රේල් මාසයේ 19 වෙනි දින පස්වරු 2.30ට, ඉහත කී අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝරම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වූ පසු දින 10ක් ඇතුළත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝරමය සඳහා තැන්පත් කරන ලද මුදල් රාජ්‍ය සන්තක කරනු ලැබේ.

7. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු කුරුණෑගල දිසාපති ගෙන් දැනගත හැකිය.

ඇස්. අමරසිංහ,
කුරුණෑගල දිසාපති වෙනුවට.

1970 මාර්තු මස 20 වෙනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේදීය.

3–116—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල්ඩබ්ලිව්/8/11.

## පුත්තලම කච්චේරිය

රු. 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියා පදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදි සමිතිවලින් මෙහි සඳහන් තැනීම් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 අප්‍රේල් මස 3 වැනි දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

(1) වන්නාතවිල්ලු මධ්‍යම පංති ව්‍යාපාරයේ කැබලි අංක 60-62 හි හියුම් පයිප්ප බෝක්කුවක් තැනීම.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී වැඩය සඳහා පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී වැඩය සඳහා රු. 25 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබා ගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබා ගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1970 අප්‍රේල් මස 2 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 මාර්තු මස 4 දින,
පුත්තලම කච්චේරියේදී ය.

3–176—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තු—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1970 මාර්තු මස 31 වෙනි අඟහරුවාද පෙ.ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

| වැඩ විස්තරය | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| 1. බූ ඇලහරහා පාලමක් ඉදි කිරීම ... ... | 25,000 0 ... | 25 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 මාර්තු මස 26 වෙනි බ්‍රහස්පතින්ද (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළ දී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම්කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1970 මාර්තු මස 2 වෙනි දින,
කුරුණෑගල වාරිමාර්ග කාර්යාලයේ දීය.

3–119—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගම්පහ උප කොටස

ගම්පහ උප කොටසේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1970 අප්‍රේල් මස 1 වෙනි බදාදා දහවල් 11 දක්වා කොළඹ 5, ජාවත්ත පාරේ බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 75,000 කට හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

| වැඩයේ නම | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|
| | රු. |
| (1) අළුත්ඇල ගල්වාන අමුණ තැනීම. | 100 |

3. 1970 මාර්තු මස 13 වෙනි දින සිට 1970 මාර්තු මස 25 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී ගම්පහ/කළුතර/රත්නපුර/කොළඹ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් අයදුම්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරණ වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

4. තවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර වැඩය ඉදිරියෙන් දක්වා ඇති අයුරු ටෙන්ඩරය වෙනුවෙන් රුපියල් සියය (රු. 100)ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාල වලින් එකක හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මෙම ටෙන්ඩරය ගැන වැඩි විස්තර හා සැලසුම් පිළිබඳ විස්තර කාර්යාල වේලාවන් තුලදී ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් බලාගත හැකිය.

ජෝ. පරමදාස්,
ගම්පහ උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන.

1970 මාර්තු මස 1 වෙනි දින,
ගම්පහ වාරිමාර්ග කාර්යාලයේ දී ය.

3–207—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් මරදගනේ වියුනිසියා ගබඩාවට පහත සඳහන් හොඳ පරන තිස් ගෝනි සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර්පත් 1970 මාර්තු 25 වැනි බදාදා ප. ව. 2.30 වන්තෙක් භාරගනු ලැබේ.—

බුසල් 2½ (දෙකහමාර) ගෝනි 1,00,000 හාල් මැනීම සඳහා.

බුසල් 3½ (තුනහමාර) ගෝනි 1,00,000 වී මැනීම සඳහා.

2. කොළඹ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරි තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගත්තා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි. මි. යෝ. ක්‍රා. හා වී. කෙ. අංශයට ඉදිරිපත් කර, 1970 මාර්තු 25 වැනි බදාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ලබාගෙන, අනුපිටපතක් ද සහිත ව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ වියුනිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරි තැනගෙන් විමසා දැනගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 මාර්තු මස 3 වන දින,
කොළඹ 7.

3–118—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### වේරහැර බොරලැස්ගමුවේ අපහරණ අංගනයේ තිබෙන අබලි බැටරි හා වෙනත් ද්‍රව්‍ය විකිණීම

වේරහැර බොරලැස්ගමුවේ අපහරණ අංගනයේ තිබෙන අබලි බැටරි, රබර් ටියුබ්, ෆිලිප්, ගැලුම් 45 ප්‍රමාණයේ පීප්ප, බෝල රේසර්, පිත්තල, වාත්තු යකඩ, ඩ්‍රම්, ටීම් සහ හබ්, මිශ්‍ර යකඩ, හල්මිල්ල පිටපලු, දුණු කොළ, යකඩ මිශ්‍ර තඹ, තිස් බරණී, බෝතල්, වාත්තු ඇලුමිනියම්, අනවශ්‍ය කඩදාසි ඇතුලත් තවත් ද්‍රව්‍ය මිලදී හැරගෙන යාම සඳහා කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් 1970. 4. 8 වෙනි දින පෙ. ව. 10 වනතුරු මුද්‍රා තැබූ ටෙන්ඩර භාරගනු ලැබේ.

ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනයට පෙර දින දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙකකින් යුක්තකොට සීල් තබා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් අවශ්‍ය ටෙන්ඩර් මුදල තැන්පත් කොට ලබාගත්තා ලද කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසුවය.

එකතුව රු. 3000 දක්වා ටෙන්ඩර මුදල් තැන්පත් කරන ටෙන්ඩරකරුවාට සියලුම තොග සඳහා ටෙන්ඩර ඉදිරිපත් කළ හැක.

වැඩ කරන සාමාන්‍ය කාලය තුළ බොරලැස්ගමුව, වේරහැර අපහරණ අංගණයේදී මෙම ද්‍රව්‍ය පරීක්ෂා කළ හැක. විකිණීමට ඇති ද්‍රව්‍ය සඳහා ලැයිස්තු හා ටෙන්ඩර තැන්පත් මුදල් පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර,
කොළඹ 5.

3–168—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්‍යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### වැඩ ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 1. | ගැටුවාන ගලහිටියාව අමුණ ... | අමුණ ඉදිකිරීම ... | වැ.වි.හ.ප. |
| 2. | හදිරවලානේ පල්ලියේ වත්ත වැවේ සොරොව්ව | අළුත්වැඩියාව ... | එම |
| 3. | බෝයගනේ ගනේගෙදර අමුණ | අමුණ ඉදිකිරීම ... | එම |
| 4. | ගුරුමඩ අඹගහ අමුණ ... | එම ... | එම |
| 5. | කලුගමුව අළුගොල්ල අමුණ... | අමුණ අළුත්වැඩියා කිරීම | එම |
| 6. | මාරාගම ළිඳපිටිය වැව ... | දියුණු කිරීම ... | එම |
| 7. | මානින්ගමුවේ හපුගහගේ අමුණ | අමුණ ඉදිකිරීම ... | ද.දෙ.හ.ප. |
| 8. | මාරාවිට නැන්වෙලේ අමුණ... | එම ... | එම |
| 9. | වලකුඹුර අමුණ ... | එම ... | එම |
| 10. | පහමුනේ අමුණ ... | එම ... | එම |
| 11. | නෙත්තිපොල ගලහිටියාව අමුණ | එම ... | එම |
| 12. | පනාගමුව අමුණ ... | වැඩිදියුණු කිරීම ... | එම |
| 13. | රනාවත්තේ පැනාවෙල අමුණ | අමුණ ඉදිකිරීම ... | එම |
| 14. | රඹේගම වැව ... | ප්‍රතිසංස්කරණය කිරීම | හි.හ.ප. |
| 15. | රක්වාන වැව ... | එම ... | එම |
| 16. | හීන්නපාවුල වැව ... | එම ... | එම |
| 17. | විලව මහවැව ... | දියුණු කිරීම ... | ව.හ.ප. |
| 18. | පහළ ගිරිබාවේ පෝට්‍රැවේ අමුණ | අමුණ බැඳීම ... | එම |
| 19. | දිවුල්ගනේ වැව ... | දියුණු කිරීම ... | එම |
| 20. | කැලේගම මහවැව ... | ප්‍රතිසංස්කරණය කිරීම | එම |
| 21. | කිරිදිගල්ලේ මීගස්අගාරේ වැව | එම ... | එම |
| 22. | හැවන්පැලැස්ස වැව ... | එම ... | එම |
| 23. | කිවුලේගම දන්ගහ වැව ... | එම ... | එම |
| 24. | කුඩාගාලේ වැව ... | දියුණු කිරීම ... | එම |
| 25. | බක්මී වැව හල්මිල්ල කොටුව වැව | එම ... | එම |
| 26. | රත්මල්ල කුඩා වැව ... | ප්‍රතිසංස්කරණය කිරීම | දෙ.හ.ප. |
| 27. | පල්ලෙල්ගිපන්පොල වැව ... | එම ... | එම |
| 28. | බැද්දේගම වැව ... | එම ... | එම |
| 29. | පොතුපිටිය වැව ... | දියුණු කිරීම ... | එම |
| 30. | බමුණු වැව නොහොත් බමුණු ගම පච්චලැ වැව | ප්‍රතිසංස්කරණය කිරීම | එම |
| 31. | කනාගේ ඇලේ කණුකැටේ බැම්ම | බැම්ම බැඳීම ... | එම |
| 32. | ගලයාය අගාර අමුණ ... | අමුණ බැඳීම ... | ක.හ.ප. |
| 33. | දේවාලේ වැව ... | ප්‍රතිසංස්කරණය කිරීම | එම |
| 34. | හත්තිනියේ බැම්ම ... | බැම්ම බැඳීම ... | එම |
| 35. | ඇටඹගහමුල බැම්ම ... | එම ... | එම |
| 36. | හුන්ගාවෙල බැම්ම ... | එම ... | එම |
| 37. | ගෝනඇල බැම්ම ... | එම ... | එම |
| 38. | මහවාන බැම්ම ... | එම ... | එම |
| 39. | තුම්මෝදර වැව ... | හොරොව්ව බැඳීම ... | එම |
| 40. | ගඩොල්ටක වැව ... | ප්‍රතිසංස්කරණය කිරීම | එම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970.3.31 වන දින දවල් 12 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින්ද දක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක් ම, ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ ''...................... සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1970.4.1 වන දින පෙ.ව. 10.00 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්‍යාලයේ තබා ඇති ''ටෙන්ඩර් පෙට්ටියට'' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාර ගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර් කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත්වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්‍යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්‍යාලීය වේලාවන් තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියෙකු විසින් 1970.4.1 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එජ්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්‍යාලය,
1970 මාර්තු මස 4 වෙනි දින දී ය.

3–212—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

6. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. මාතලේ දිසාපති තැනගෙන් අවසරයක් නො ලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාර දීමට හෝ පුළුවන් කමක් නැත. එසේම පත් කරණු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයේ අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු හෝ ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට ඔවුන්ගේ ලියා පදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන් ය. ලියාපදිංචි නොවූ අය තමාට රු. 50,000 වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියාපදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. නමුත් සමිති ලියාපදිංචි කළ බවට හා වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ද ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය භාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරණ සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ජේ. එච්. ඇම්. අබේකෝන්,
මාතලේ දිසාපති වෙනුවට.

1970.3.3 වැනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දීය.

3–192—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට පොලිතින් වියුබිලර් කඩදාසි හොන්ඩර 650 ක් සැපයීම හා ගෙනැවිත් බාරදීම සඳහා, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු මස 31 දින අ. භා. 2.30 දක්වා මිළ ගණන් පත් බාරගනු ලැබේ.

වැඩි විස්තර හා මිළ ගණන් ඉල්ලුම්පත් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 මාර්තු මස 3 වන දින,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

3–120—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අතුත්, කොළඹ 8, මැගසින් පාරේ පිහිටි බේකරියට ගිනිසපු ලීයෙන් පාන් පෙට්ටි 40ක් සාදා සැපයීම සඳහා මිළ ගණන් පත් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී.එස්. එස්.අයි. ගොඩනැගිල්ලේ, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 මාර්තු මස 31 දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

මිළ ගණන් ෆෝර්ම සහ වැඩි විස්තර කොළඹ 1, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ලේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1970.3.31 දින දවල් 12 දක්වා ලබාගත හැක.

මී. ස. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.3.3 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

3–121—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

**ඉවතලන කඩදාසි මිළ දී ගැනීමට සහ ඉවත් කර නැනීම සඳහා මිළ ගණන් කැඳවීම**

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විභාග දෙපාතීමේන්තුවේ එකතුවන පහත විස්තර සඳහන් ඉවතලන කඩදාසි මිළදී ගැනීමට සහ ඉවත් කර ගැනීමට මිළ ගණන් 1970 මාර්තු 26 වැනි දින පස්වරු 2.30 දක්වා මෙයින් කැඳවනු ලැබේ.

(1) පරන උත්තර පත්‍ර, පරණ ප්‍රශ්න පත්‍ර සහ අවලංගුවූ ආකෘති පත්‍ර

(2) ඉවතලන වෙනත් කඩදාසි (පාවිච්චි කළ නොහැකි දුඹුරු කඩදාසි, ලොකු කවර, කුණු කුඩාවල එකතුවන කඩදාසි යනාදිය)

පරන උත්තර පත්‍ර, පරන ප්‍රශ්න පත්‍ර සහ අවලංගු වූ ආකෘති පත්‍ර ගෙන යෑමට පෙර ඒවා තමාගේම වියදමින්ම කඩදාසි කපන යන්ත්‍රයකින් රහස්‍ය භාවය ආරක්ෂා වන අන්දමින් කැපිය යුතුය.

ඉදිරිපත් කරන මිළ ගණන් වල පරන උත්තර පත්‍ර, පරන ප්‍රශ්න පත්‍ර සහ අවලංගු වූ ආකෘති පත්‍ර හොණ්ඩරයකට ගෙවන මුදලත් අනිකුත් ඉවතලන කඩදාසි හොණ්ඩරයකට ගෙවන මුදලත් වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුයි.

එක් එක් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් විභාග දෙපාර්තමේන්තුවේ රුපියල් 100 ක මුදලක් තැන්පත් කර එම රිසිට් පතේ අංකය සහ දිනයද මිළ ගණන් පත්‍රයේම සුදුසු තැනක සඳහන් කළ යුතුයි.

ස්වකීය ඉල්ලුම් පත්‍රය භාරගත් බවට ලිඛිත දැන්වීමක් ලද තුන් දිනක් ඇතුළත කිසියම් ඉල්ලුම් කරුවෙකු විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබුවොත් ඔහු විසින් තැන්පත් කර ඇති මුදල අහිමි වනු ඇත.

පිළි නොගත් ඉල්ලුම් කරුවන්ගේ තැන්පත් මුදල් යථා කාලයේදී ආපසු ගෙවනු ලැබේ.

මිළ ගණන් බහාලනු ලබන ලියුම් කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ "ඉවතලන කඩදාසි මිළදී ගැනීම සඳහා මිළ ගණන්" යන්න සඳහන් කළ යුතුය. සීල් තබන ලද ලියුම් කවර කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මිළ ගණන් එවන ලද අයවලුන්ට ඒවා විවෘත කරන ඉහත කී වේලාවලදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

මෙම කඩදාසි වල ආදර්ශයන් සතියේ දිනවල පෙරවරු 9 සිට පස්වරු 4 දක්වාත් පෙර පෝය දිනවල පෙරවරු 9 සිට පෙරවරු 11.30 දක්වාත් කොළඹ 2 විභාග දෙපාර්තමේන්තුවේදී පරීක්ෂා කර බැලීමට පුළුවන.

මිළ ගණන් භාරගත් බව දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීමෙන් පසු වරින් වර එකතුවන කඩදාසි වටිනාකම අනුව මුදල් ගෙවා නොපමාව ගෙන යා යුතුය.

භාණ්ඩ අංක (1) සාර්ථකවූ ඉල්ලුම්කරු රු. 1,000 ක මුදලක් ඇප වශයෙන් විභාග දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ යුතුය.

කේ. පී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 මාර්තු මස 3 වැනි දින,
කොළඹ 2, විභාග දෙපාර්තමේන්තුවේදී ය.

3–113—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

## ආහාර දෙපාර්තමේන්තුව

### ටොන් 8-10 ප්‍රමාණයේ අළුත් ඔස්ටින් ලොරි වැසි 20ක විවෘත වර්ගයේ ලොරි බොඩි තැනීම

කොළඹ, යූනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් විසින්, ටොන් 8-10 ප්‍රමාණයේ අළුත් ඔස්ටින් ලොරි වැසි 20ක විවෘත වර්ගයේ බොඩි තැනීම සඳහා ටෙන්ඩර් 1970 මාර්තු 24 දින පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත මුදලින් රු. 250 ක් තැන්පත් කර 1970 මාර්තු 23 දින දහවල් 12 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර අනුව ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය පිළිබඳ සියළුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ඔහුගෙන් ලබා ගත හැකි ය.

ඇම්. ඩී. ඩී. පීරිස්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1970 මාර්තු 4 දින,
330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

3-175—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

පියලි කරන ලද හන්ගේරියානු පරිප්පු හොණ්ඩර 29,000 කට ආසන්න තොගයක්, හොණ්ඩර 1,000 කට නොඅඩු තොග අනුව මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම 1970 මාර්තු 24 වෙනි දින පස්වරු 2.30 ට අවසන් වේ. ටෙන්ඩර්කරුවෙකුට එකක් හොණ්ඩර 1,000 බැගින් වූ තොග වැඩි ගණනක් හෝ හොණ්ඩර 29,000 මුළු තොගයම මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර ඒවා සීල් තැබූ කවරයක බහා එම ලියුම් කවරයේ මුදුනේ වම් කෙලවරේ "පියලිකරණ ලද හන්ගේරියානු පරිප්පු මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා 1970.3.3 දින පස්වරු 4 ඉක්මෙන්නට ප්‍රථම, කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330, දරණ ස්ථානයේ ආහාර කොමසාරිස්ට ලැබෙන සේ ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත් ලියා පදිංචි කළ තැපැලෙන් නොඑවන ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා එම කවරයේ මුදුනේ වම් කෙලවරේ අවශ්‍ය විස්තර සඳහන් කොට වම් කෙලවරේ පහල ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියා ඔවුන් හෝ මවුන්ගේ නියෝජිතයන් විසින් ඒ සඳහා ආහාර කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

3. කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ පිහිටි ආහාර කොමසාරිස් කාර්යාලයෙන් 1970.3.20 දින ප. ව. 2 දක්වා ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් කාර්යාලයේදී 70.3.24 දින සවස 2.45 ට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. ඉහත සඳහන් කර තිබෙන ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන දිනයේ එම වේලාවට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර් විවෘත කරණ නිලධාරියා ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඉදිරිපත් කර ඇති ගාස්තු ප්‍රමාණයන් එම ස්ථානයේ සිටින ටෙන්ඩර්කරුවන්ට ඇසෙන සේ කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට කිසියම් ටෙන්ඩර් පත්‍රයක දෙවෙනි පිටපත පරීක්ෂා කර බැලීමට අවශ්‍ය නම් ආහාර කොමසාරිස්ගේ අවසරය ඇතිව එසේ කිරීමට අවසර දෙනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරණ මිල ගණන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ දින සිට සති 4 ක් දක්වා, ස්ථිරව හා වලංගුව පැවතිය යුතුය. ටෙන්ඩර් පත්‍ර අත්සන් කළ යුතු අතර සියලුම වෙනස් කිරීම් හා මකා දැමීම් කෙටි අත්සන යොදා සහතික කළ යුතු වේ. ටෙන්ඩර් කොන්දේසිවල පිටපතක් ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කර ටෙන්ඩරයට ඇමිනිය යුතුය.

6. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම සඳහා ආහාර කොමසාරිස් වෙත කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ පිහිටි ඔහුගේ කාර්යාලයේදී හො. 1,000 එක් එක් තොගය සඳහා රුපියල් 500 ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දැක්වෙන ලිඛිත නිවේදනය ලියා පදිංචි කළ තැපැලෙන් ලත් දින සිට දින 14 ක් ඇතුළත දී ටෙන්ඩර්කර ඇති මිල ගණන් ගෙවා එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කලහොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඉන්පසු රජයේ කිසිම කොන්ත්‍රාත්තුවක් ඇති කර ගැනීමට නොහැකි වනසේ ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් සපයා ඇති ලිපිනයට තැපැලෙන් යවා ඇතහොත් හෝ එම ලිපිනයට භාර දුනහොත් එය ටෙන්ඩර්කරුට ලැබුනා සේ සලකනු ලැබේ. අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

7. කොළඹ, චාමස් ධාන්‍යාගාරයේ සහකාර ආහාර පාලක සමග කලින් පිළියෙල කර ගැනීමෙන් පසු සතියේ වැඩ කරන ඕනෑම දිනයක සාමාන්‍ය වැඩ කරණ කාලය ඇතුළත චාමස් ධාන්‍යාගාරයේදී ඉහතකී පියලි කරන ලද හන්ගේරියානු පරිප්පු පරීක්ෂා කර බැලීමට පුළුවන.

8. කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සහ ටෙන්ඩරයක ඕනෑම කොටසක් භාර ගැනීම පිළිබඳ සම්පූර්ණ අයිතිය ආහාර කොමසාරිස් සතුය.

දෙ. ලී. චන්ද්‍රසේකර,
වැ. බ. ආහාර කොමසාරිස්.

1970. 3. 3 දින,
330, යූනියන් පෙදෙස,
කොළඹ 2.

3-174—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මැලතියන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මැලතියන් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර තැ.පෙ. 584 හිමි කොළඹ, රජින වීදියේ සෙලින්කො මන්දිරයේ පස්වෙනි මාලයේ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 අප්‍රියෙල් මස 30 වැනි බ්‍රහස්පතින්ද පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලින් ;

(ii) 1 වැනි ඡෙදයේ (iv) වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඔස්ට්‍රේලියාව ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1970 මාර්තු 2 දින.

SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Malathion 50% water dispersible powder—in accordance with the WHO Specifications No. WHO/SIF/10.R2 approved on 25.10.65—as appearing at page 113 of WHO specifications for Pesticides 1967 Edition | 500,000 lbs. .. | In 100 lb. (nett) suitable, new clean drums which shall contain an inner liner or bag of polythelene or equivalent, nominal thickness of 0.1 mm. The inner-liner or bag shall be hermetically sealed after filling. |

3-109—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| කො/මරදාන ලංකා කාර්මික විද්‍යාලය | ගිනි තෙත් හානිවූ ගොඩනැගිල්ල නැවත තැනීම. |

සංලක්ෂ්‍යය—කො/කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර, එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 1,20,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, 1970 අප්‍රේල් මස 2 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරයක බහා, මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 3 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට, ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

වී. ජී. බී. මුණසිංහ,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 1 වැනිදා,
කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

3-122—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බණ්ඩාරවෙල

1970 අප්‍රියෙල් මස 10 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| බ/බදුල්ල විශාඛා බාලිකා මහා විද්‍යාලය | පන්ති කාමර 8 දෙමහල් ගොඩනැගිල්ල. |
| බ/බදුල්ල ධම්දූත මහා විද්‍යාලය... | පන්ති කාමර 8 දෙමහල් ගොඩනැගිල්ල. |
| බ/බණ්ඩාරවෙල විශාඛා බාලිකා මහා විද්‍යාලය | පන්ති කාමර 8 දෙමහල් ගොඩනැගිල්ල. |

සංලක්ෂය : බ=බදුල්ල දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 1,25,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 අප්‍රියෙල් මස 9 වැනි දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාතීමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 අප්‍රේල් මස 10 වැනි දා පෙ. ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. ඊ. ජී. මෙන්ඩිස්,
ඌව ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 මාර්තු මස 2 වන දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදීය.

3–214—70. 3. 13 දින අංක 14,897 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

පහත සඳහන් සේවාවන් කිරීම සඳහා 1970. 3. 28 දින පෙ. ව. 10 වන තෙක් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්වල ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50ක් ගෙවීමෙන් ලබාගත හැකිය :—

**එඬේරමුල්ලේ වීනච්චචිටි වාත්තු වැඩපළේ—**

(අ) භූමිය සුද්ධ කිරීම සහ සමතලා කිරීම.

(ආ) ටොන් 800ක් පමණ වූ ගල් අඟුරු තොගය එක තැනකට ගෙන ගොස් විශාල ගොඩක් වශයෙන් අඩුක් කිරීම.

(ඇ) යකඩ කැබලි එක්කාසු කිරීම සහ ඒවා ගොඩක් වශයෙන් අඩුක් කිරීම.

ටෙන්ඩර් කිරීමට කැමති අයවලුන්, එඬේරමුල්ලේ, වාත්තු කම්හලේ ප්‍රධාන ඉංජිනේරු තැන හමුවී කිරීමට ඇති වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය කරන සෑම විස්තරයක්ම ලබාගත යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් 1970.3.27 දින දහවල් 12න් පසුව භාරගනු නොලබන අතර, ටෙන්ඩරය අවසාන වන දිනයේදි ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. අංක 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

3–75—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ කැළණිවැලි අංගන දැව ගබඩාවේ ඇති පහත ඇති උපලේඛනයේ සඳහන්, තේක්ක කඳන් සඳහා මුද්‍රා තැබූ පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්, රත්මලානේ කල්දෙමුල්ල පාරේ රාජ්‍ය දැව සංස්ථාවේ කොළඹ ප්‍රාදේශීය කළමණාකාර තැන විසින් 1970 මාර්තු 25 වන දින පූ.භා. 10 වන තෙක් භාර ගනු ලැබේ.

එක් එක් තොගය වෙනුවෙන් රු. 100 බැගින්, ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් වශයෙන් කොළඹ, රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති නමට ගත් මුදල් ඇනවුම් ඉදිරිපත් කළවිට පහත සඳහන් නම් අය විසින් 1970 මාර්තු 24 වන දින අ.භා. 3 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

කොළඹ, ඩී. ආර්. විජයවර්ධන මාවතේ කැළණිවැලි අංගන දැව ගබඩා පාලකගෙන් හෝ රත්මලාන, කල්දෙමුල්ල පාරේ කොළඹ, ප්‍රාදේශීය කළමණාකාර තැනගෙන් වැඩි විස්තර ලබා ගත හැක.

ඩබ්ලිව්. ඊ. ඇස්. ගුණවර්ධන,
ප්‍රාදේශීය කළමණාකාර තැන, කොළඹ.

ප්‍රාදේශීය කළමණාකාර තැනගේ කාර්යාලය,
රාජ්‍ය දැව සංස්ථාව,
කල්දෙමුල්ල පාර, රත්මලාන,
1969 දෙසැම්බර් 22 දින.

### උපලේඛනය

| තොග අංකය | කඳන් ගණන | වර්ගය | ඝන අඩි ප්‍රමාණය |
|---|---|---|---|
| 1 ... | 6 ... | තේක්ක ... | 96·7 |
| 2 ... | 7 ... | එම ... | 102·3 |
| 3 ... | 6 ... | එම ... | 109·6 |
| 4 ... | 5 ... | එම ... | 96·1 |
| 5 ... | 6 ... | එම ... | 90·1 |

3–77—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 අප්‍රේල් මස 10 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| 1. මැදිකිඳ ප්‍රා.ආ.නි. කොටසේ, හීල් ඔය-මකුල්ඇල්ල පාරේ 1 වෙනි සැතපුමේ බෝක්කු තැනීම | 15,000 |
| 2. කිත්තැන්න ප්‍රා.ආ.නි. කොටසේ, ගලිගමුව-යල්වෙල-නෙළුව පාරේ 5 වැනි සැතපුම තැනීම (පස්වැඩ හා බෝක්කු) | 20,000 |
| 3. යටිකිඳ ප්‍රා.ආ.නි. කොටසේ, තල්දෙන-අංගොඩ පාර—1 වන සැතපුම් ½ ගල් දමා තාර දැමීම හා වැඩිදියුණු කිරීම | 30,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1970 අප්‍රේල් මස 4 වැනි දින පස්වරු 3 තෙක් බදුල්ලේ කච්චේරියේදී ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම් අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම තැපැලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1970 අප්‍රේල් මස 10 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස් ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, ප්‍රහුණු නුපුහුණු යන දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත් කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා “ලාංකික” යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, පෙරෙව්වූ පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ දිසාපතිගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
**බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.**

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1970 පෙබරවාරි මස 27 වැනි දින.

**3–98—70.3.13 දින අංක 14,897** දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1969/70 වර්ෂය සඳහා සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම

රජයේ පාසල්වලට හා ලංකා ශිෂ්‍ය භට බලකායට අවශ්‍ය සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1970 අප්‍රේල් මස 4 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර පත්‍ර, පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1970 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 4.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4 සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ “සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම—1969/70 සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය” යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8 කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මාර්තු මස 3 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

**3–100—70.3.13 දින අංක 14,897** දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### කැඳ (ස්ටාච්)

වාලච්චේනෙයිහි නැගෙනහිර කඩදාසි කම්හලට “ස්ටාච්” දිග ටොන් 40ක් (දිග ටොන් 1=රු. 2240) සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවේ.

1970 මැයි 15 වැනිදා ටෙන්ඩර් භාරගැන්ම අවසන් කෙරේ. මූලිකයන්ගේ/සැපයුම්කරුවන්ගේ නම් හා ලිපිනයන් සඳහන් කර අයැදී විට ටෙන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර ලබාගත හැක.

ති. බ. තාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2.

**3–149—70.3.13 දින අංක 14,897** දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සම්ප්‍රේෂක ස්ථානය තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කටුනායක, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 ක්වූ අප්‍රේල් මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කටුනායක, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමයේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 75,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ක්වූ මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ

සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5 ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එස්. නාගලිංගම්,
ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු,
කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමය.

කටුනායක ගුවන් තොටුපල සංවර්ධන යෝජනා ක්‍රමය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
කටුනායක.
1970 මාර්තු මස 2 වැනි දින,

3–102—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මහනුවර කෞතුකාගාරයේ හදිසි අළුත්වැඩියා කිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා එවන ටෙන්ඩර්පත්‍ර මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 1970ක්වූ අප්‍රේල් මස 9 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

මහනුවර/ගො/දෙ හි දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට හැකිය.

ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 28,300කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1970 මාර්තු මස 25 වෙනි බදාදා ප. ව. 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර්පත් ප්‍රමාදවී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10ක් බැගින් වූ ආපසු නොගෙවනු ලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරණ නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරණ අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලුම විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ගොඩනැගිලි දෙපාතර්මේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

සී. යෝගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගො).

අධිකාරි ඉංජිනේරු කායසීලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
70. 2. 26.

3–66—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වවුනියා දිස්ත්‍රික්කයේ, වවුනියා දිස්ත්‍රික්ක රෝහලේ පිරිමි වාට්ටුවට සිලිම සැපයීම සඳහා වූ ටෙන්ඩර්පත් උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, වෙරළ පාර, යාපනය කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 අප්‍රේල් මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. වවුනියා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙළ කොට අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,600 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා, පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 ක් බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා, ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර්පත් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

තෙ. මාණික්කම්,
උතුරු කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැන
(ගොඩනැගිලි)

1970 මාර්තු මස 2 වෙනි දින,
උතුරු කොට්ඨාශයේ
අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
වෙරළ පාර, යාපනය.

3–123—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ලග්ගල, බලවේග පෙහෙකම් වැඩපල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 අප්‍රේල් මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,80,500 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 මාර්තු මස 26 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින්

එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිළධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඩබ්ලිව්. ඇන්. ජී. වොට්සන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
" වර්ක්ස් වර්ක්ස් " මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970.3.5.

3–213—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 7, මහාමාර්ග දෙපාර්තමේන්තුවේ, බටහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් කොළඹ-හොරන පාරේ අංක 22/3 බෝක්කුව නැවත සෑදීම සඳහා වූ ටෙන්ඩර් පත්, 1970 මාර්තු මස 25 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාරගනු ලැබේ.

2. කොළඹ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘතිපත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතකින් ද යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගතහැකිවන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයෙන් බලාගැනීමට පුලුවන.

3. රු. 11,000 නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය 1970 මාර්තු මස 20 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු නොගෙවන පමාවීමේ ගාස්තුවක් නිකුත්කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, පහල චැතැම් වීදියේ පිහිටි මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළහැක.

එස්. පත්මනාදන්,
අධිකාරී ඉංජිනේරු, බටහිර කොට්ඨාශය
(මහාමාර්ග)

මහාමාර්ග දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 මාර්තු 4.

3–179—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසිය

කැකිරාව අඩවියේ ඇති පලු, බුරුත, මිල්ල සහ වැවරණ යනාදී වර්ගයන් ට අයත් කඳන් 12 කින් යුත් ඝන අඩි 547.8ක් සහ ඉරූ දැව හුලංහීක්, මිල්ල සහ බුරුත යනාදි කෑලි 59 කින් යුත් ඝන අඩි 32.5 ක්, තේක්ක වටකනු I වන පන්තියේ 500 ක් ද, වටකණු II වන පන්තියේ 414 ක්, සිලිපර 50 ක් සහ ඉරුම් කියතක් ත්‍රිකුණාමලයේ උතුරු මැද දිසා වන නිලධාරි විසින් 1970.3.24 වැනි දින පෙරවරු 10 ට කැකිරාව අඩවි වන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අපේක්ෂිත ඉල්ලුම්කරුවන් වෙන්දේසියට ප්‍රථමයෙන් දැව පරීක්ෂාකර බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර මගෙන් හෝ කැකිරාවේ අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැක.

එච්. ආර්. පීරිස්,
දිශා වන නිලධාරි, උ. මැ. දි.

දිශා වන නිලධාරි කාර්යාලය,
ත්‍රිකුණාමලය.

3–208—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

හලාවත අඩවියේ විල්පොත සහ වෙනත් ස්ථානවල ඇති බුරුත, පලු, හල්මිල්ල, වැලිපැන්න, තේක්ක, පානක්කා, වැවරණ හා මොර යන වර්ගවලට අයත් ඝන අඩි 1,553.3 ක්වූ කඳන් 280 ක් සහ දර යාර 129 ක් ද වන දැව තොග 28 ක් 1970 මාර්තු මස 25 වෙනි දින පෙ. ව. 11 ට වයඹ දිසා භාර වන නිලධාරි වන ම විසින් හලාවත අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර දැව පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර සඳහා හලාවත අඩවි වන නිලධාරි හෝ වයඹ දිසා වන නිලධාරි විමසන්න.

ඊ. සී. ද ඉසඩ්. වීරවර්ධන,
වයඹ දිසාභාර වන නිලධාරි,
කුරුණෑගල.

1970 මාර්තු 2 දින,
කුරුණෑගල.

3–209—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසිය

අනුරාධපුර අඩවියේ හල්මිල්ල, තේක්ක, විශේෂ I වන පන්තියේ, II වන පන්තියේ සහ III වන පන්තියෙන් සමන්විත කඳන් 194 ක් ඝණ අඩි 1,338.3 ක්, ඉරූ දැව කෑලි 64 කින් සමන්විත ඝණ අඩි 45.9 ක්, I වන පන්තියේ වටකනු 111 ක්, II වන පන්තියේ තේක්ක වට කනු 6 ක්, කියතක්, අලවංගුවක්, කැත්තක්, පොරවක්, වැයක්, කොක්කක්, පඩියක්, පීරි තුනක්, කෝදුවක්, පිහියක්, ලනුවක්, රේක්ක දෙකක්, ලන්තෑරුමක්, සහ මැදවච්චියේ දැව මඩු දෙකක තිබෙන එයට අයත් දැව සහ වහලෙහි තිබෙන සින්ක් තහඩු ත්‍රිකුණාමළයේ උතුරුමැද දිශාවේ දිසාවන නිළධාරි විසින් 1970 මාර්තු මස 25 වැනි දින පෙ. ව. 10 ට අනුරාධපුර අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අපේක්ෂිත ඉල්ලුම්කරුවන් වෙන්දේසියට ප්‍රථමයෙන් දැව පරීක්ෂාකර බලා සෑහීමට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

අපේක්ෂිත ඉල්ලුම්කරුවන් වෙන්දේසි සඳහා ඇති කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතු බව සළකන්න. වැඩි විස්තර මගෙන් හෝ අනුරාධපුර අඩවි වන නිළධාරි ගෙන් ලබා ගත හැක.

එච්. ආර්. පීරිස්,
දිශා වන නිළධාරි, උතුරු මැද දිශාව.

දිශා වන නිළධාරි කාර්යාලය,
ත්‍රිකුණාමලය.

3–210—70.3.13 දින අංක 14,897 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාලම් පාරු රේන්ද

(1) ගංගෙයි, (2) මූතූර්, (3) කිලිවෙඩ්ඩි, (4) උප්පාර්, (5) සලපෙයි ආරු, (6) කඩ්වේ පරිච්චාන්, (7) පුඩවයිකාඩු, (8) යාන්ඔය සහ (9) ඉඩ්ඩිමන් තුරේ, යන පාලම් පාරු 1970 මැයි මස 1 වැනි දින සිට ආරම්භ වන මාස අටක කාල සීමාව සඳහා විකිණීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති විසින් 1970 අප්‍රේල් 5 වැනි දින පෙරවරු 10 වන තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් ත්‍රිකුණාමලය කච්චේරියෙහි රු. 100 ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටදී ත්‍රිකුණාමලය කච්චේරියෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට හැකිය. 1970 අප්‍රේල් මස 4 වැනි දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම නියමිත දින පෙරවරු 10 ට සිදු කරනු ලබන අතර ඒ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන් හට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ලේඛන ගත තැපැලෙන් ඉදිරිපත් නො කරනු ලබන ටෙන්ඩර් පත් පුද්ගලිකව පැමිණ කච්චේරියට බාර දිය යුතුය. එය බහා එවන කවරයෙහි සේවා විස්තර සහ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව සඳහන් කර එවිය යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලෙන් තුනෙන් කොටසක් ඇප මුදලක් වශයෙන් කලින් ගෙවිය යුතුය.

ස්වකීය ටෙන්ඩරය භාර ගත් බවට ලිඛිත දැන්වීමක් ලද තුන් දිනක් ඇතුළත කිසියම් ටෙන්ඩර්කරුවකු විසින් ඒ සම්බන්ධ ගිවිසුමකට බැඳීමට හෝ නියමිත ඇප මුදල තැන්පත් කිරීමට හෝ අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කර ඇති ටෙන්ඩර් පත්‍ර මුදල් අහිමි වනු ඇත.

ටෙන්ඩර් කොන්දේසි සතියේ ඕනෑම දිනයක (පෝදා හැර) පෙර වරු 9 සිට පස්වරු 4.30 දක්වා (පෝදිනයට පෙර දින නම් පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා, ත්‍රිකුණාමලය කච්චේරියේ දී බලා ගත හැක.

කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් කිසිදු ප්‍රශ්නයක් නැතිව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය තිරිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති සතුවේ.

ඇස්. සිවඥනම්,
සහකාර දිසාපති,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවටය.

1970 පෙබරවාරි මස 24 දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

3-178—70.3.13. වැනි දින 14,897 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

### 1970

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 70. 4. 3 සිකුරාද | ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.10 සිකුරාද | ... | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.17 සිකුරාද | ... | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 4.24 සිකුරාද | ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 4.30 බ්‍රහස්පතින්ද | ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | ... | 70. 5. 8 සිකුරාද | .. | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 5.15 සිකුරාද | .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.22 සිකුරාද | ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 5.29 සිකුරාද | ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.